# කුලී පදනම මත ලබා ගන්නා වාහන සඳහා පිරිවිතරයන්

Revised on 14-01-2019

<u>පටුන</u>


1. කාර්මික 6bm 2

2. පොදු 6bm 3

## කුලී පදනම මත ලබා ගන්නා වාහන සඳහා

## පිරිවිතරයන්

**1. කාර්මික**

**1.1** ඉදිරිපත් කරන වාහන හොඳ තත්ත්වයේ විය යුතු අතර, මුල් ලියාපදිංචි දිනය, ලංසු දත්තයන් හි දක්වා ඇති ආකාරය සමඟ අනුකූල විය යුතුය.

**1.2** ඉදිරිපත් කරන වාහන පූර්ණ රක්ෂණය කර තිබිය යුතු අතර, පහත සඳහන් ආකාරයට ආවරණය කර තිබිය යුතුවේ. මෙම රක්ෂණ සහතිකයේ පිටපතක් ලංසුව සමඟ ඉදිරිපත් කල යුතුය.

**1.2.1** කුලියට දීම හා ගැනීම **(Letting and Hiring)**

**1.2.2** ගමන් ගන්නා සියළුම පුද්ගලයින් හා භාණ්ඩ

**1.3** අඩුම බර පැටවීමේ ධාරිතාව පහත සඳහන් ආකාරයට විය යුතුය

**1.3.1** වෑන් රථ සඳහා කි.ග්‍රෑම් **750**

**1.3.2** ක්‍රෑ කැබ් රථ සඳහා කි.ග්‍රෑම් **1150**

**1.4** අඩුම එන්ජින් ධාරිතාව වෑන් රථ හා කැබ් රථ සඳහා **1900 CC** විය යුතුය.

පෙට්‍රල් කාර් සඳහා එන්ජින් ධාරිතාව **1500 CC** ට වැඩි විය යුතුය.

ඩීසල් කාර් සඳහා එන්ජින් ධාරිතාව **1800 CC** ට වැඩි විය යුතුය.

කෘ කැබ් රථ සඳහා එන්ජින් ධාරිතාව **2400 CC** ට වැඩි විය යුතුය.

**1.5** වායු සමන යන්ත්‍ර පද්ධතිය ඉතා හොඳ තත්ත්වයේ තිබිය යුතු අතර, වෑන් රථ සඳහා ද්විත්ව වායු සමන පද්ධතියක් තිබිය යුතුය.

**1.6** වාහනයේ ආසන දෙකක් අතර, පාද සඳහා ඇති පරතරය අඩුම වශයෙන් අඟල් **12** ක් විය යුතුය.

**1.7** හොඳ තත්ත්වයේ **FM** ගුවන් විදුලි යන්ත්‍රයක් / කැසට් ධාවන යන්ත්‍රයක් තිබිය යුතුය. **[Full range FM frequencies (76-107 MHz)]**

**1.8** ඇතුලත කාපට් සියල්ල හොඳ තත්ත්වයේ තිබිය යුතුය.

**1.9** රියදුරා සඳහා හා ඉදිරි අසුනේ සිටින අනෙක් තැනැත්තා සඳහා “ආරක්ෂක පටි” තිබිය යුතුය.

1.10 ඉදිරිපත් කරන වෑන් රථ වල හා ක්රූ කැබ් රථ වල රියදුරු සමඟ මගීන් අවම වශයෙන් 05 ක් හෝ කොන්ත්‍රාත් දත්තයන්ගේ දක්වා ඇති ප්‍රමාණයෙන් වැඩි මගීන් ප්‍රමාණයක් සඳහා ගමන් කල හැකි පරිදි ආසන තිබිය යුතුය.

1.11 වාහනයේ ශ්‍රී ලංකාවේ මුල් ලියාපදිංචි දින ලංසු විවෘත කරන දිනට අවු: 10 කට අඩුවිය යුතුය.

## 2.0 පොදු

2.1 කොන්ත්‍රාත්කරු විසින් වාහන සඳහා රියදුරු මහතුන් සැපයිය යුතු අතර, ඒ අය සඳහා වාහන පැදවීමේ වලංගු බලපත්‍ර තිබිය යුතුය. ඒවායේ පිටපත් ලංසුව සමඟ ඉදිරිපත් කල යුතුය.

2.2 රියදුරු මහතුන් මනා සෞඛ්‍ය තත්ත්වයේ පසුවන අය විය යුතු අතර, ඔවුන්ට ලිවීමේ හා කියවීමේ හැකියාව තිබිය යුතුය.

2.3 ඉදිරිපත් කරන වාහන සෑම දිනයකම පෙ.ව.8.00 සිට ප.ව.5.00 දක්වා සේවය සඳහා සැපයිය යුතු අතර, වාහනය භාර නිලධාරියාගේ අභිමතය පරිදි රජයේ හා වෙළඳ නිවාඩු, දිනයන්හි සේවය සඳහා සැපයිය යුතුය. ඉහත සඳහන් දිනයන්හිදී කාර්යාල වේලාවන් තුළ හා කාර්යාල වේලාවෙන් පසුවද වාහනය ධාවනය සඳහා සූදානම් කළ යුතුය.

2.4 ඉදිරිපත් කරන ලද වාහන, යම් අනතුරක් නිසා හෝ අළුත්වැඩියාවන් නිසා සේවය සඳහා සැපයිය නොහැකි නම්, ඒ වෙනුවට වෙනත් වාහනයක් සැපයිය යුතුය. එවිට සපයන වෙනත් වාහනයද පහත සඳහන් අවශ්‍යතා සපුරා තිබිය යුතුය. රාජකාරී වේලාවෙන් පසුව වුවද මෙම දිනයන්හිදී වාහන ලබාදිය යුතුය.

(a) ඉහත සඳහන් විස්තරයන්ට අනුකූල වීම.

(b) මුල් වාහනයේ වර්ගයටම අයත් වීම (උදා: මුල් වාහනය වෑන් රථයක් නම් ඒ වෙනුවට ඉදිරිපත් කරන වාහනයද වෑන් රථයක් වීම)

අදාල අංශ භාර නිලධාරියාගේ අනුමැතිය අනුව මෙසේ දින 03 ක් සඳහා පමණක් වෙනත් වාහනයක් සැපයිය හැකිය. දින 03 සිට දින 30 උපරිමයක් දක්වා වෙනත් වාහනයක් සැපයීම අවශ්‍ය වේ නම්, ඒ සඳහා අදාල කළමණාකරුගේ අනුමැතිය ලබාගත යුතුය. මේ සඳහා පිළිගත හැකි කරුණු හා සාක්ෂි ඉදිරිපත් කල යුතු වේ.

දින **30** ට වැඩි වන විට ඒ හා සමාන (ටෙන්ඩර් පත්‍රයේ ඇති පිරිවිතරයන්ට සමාන) වෙනත් වාහනයක් ඉදිරිපත් කර ඉංජිනේරුවරයාගේ නියෝජිතයාගේ අනුමැතිය සඳහා පළමු දින **30** අවසන් වීමට දින **10**කට පෙර කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ යුතුයි.

කෙසේ වෙතත් ඉදිරිපත් කරන වෙනත් වාහනයක් සඳහාද පහත සඳහන් සහතික වල පිටපත් සැපයීම අත්‍යාවශ්‍යය.

(a) පූර්ණ රක්ෂණ සහතිකය (මුල් වාහනයේ ආකාරයට)

(b) ආදායම් බල පත්‍රය

(c) ලියාපදිංචි සහතිකය

(d) වාහනය අයිතිකරු වාහනය සැපයීම සඳහා කැමැත්ත ප්‍රකාශ කරන ලිපිය

**2.5** දින **03** ක් දක්වා නොදන්වා සේවය සඳහා වාහනයක් නොසැපයුයේ නම් කාර්යය සාධක ඇපකරයට යටත්ව කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබේ. එසේම කොන්ත්‍රාත්කරු අසාධු ලේඛනගත කරනු ලැබේ.

**2.6** මණ්ඩලය මගින් සපයනු ලබන ධාවන සටහන් පත්‍රිකාවන්හි නියමිත පරිදි දිනපතා ධාවනය කරන කි.මී. ප්‍රමාණය සටහන් කර වාහනයේ භාවිතා කරන නිලධාරියාගේ අත්සන ලබාගත යුතු බව කොන්ත්‍රාත්කරු විසින් රියදුරුට උපදෙස් ලබා දිය යුතුය.

**2.7** වාහනය යොදවනු ලබන ස්ථානයට අමතරව රාජකාරි අවශ්‍යතා අනුව වෙනත් ස්ථානයන් සඳහාද වාහනය, සැපයීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.